# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date } 2024.05.30 |

පැමිණිලිකරුවන් - 01. එම්. ඒ. කේ.එම් රිෆා මිය

129/4, සද්ධර්ම මාවත, කොළඹ 10

- 02. එම්.ඒ.සී.සම්පත් මයා,

142, එක්සත් මාවත, මහර, කඩවත.

වගඋත්තරකරුවන් - 01. අධ්‍යක්ෂ ජනරාල්,

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ

දෙපාර්තමේන්තුව,

මාළිගාවත්ත, කොළඹ 10.

02. ප්‍ර.පො.ප අනුරුද්ධ හේරත්,

ස්ථානාධිපති, පොලිස් ස්ථානය - දෙහිවල.

03. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - මංගල දෙහිදෙණිය,

පොලිස් අධිකාරී කාර්යාලය, ගල්කිස්ස.

04. නියෝජ්‍ය පොලිස්පති - ජී.එච්.මාරපන මයා,

බස්නාහිර පළාත දකුණ

පැමිණිලි අංක - **එච්.ආර්.සී/16/24, එච්.ආර්.සී/26/24**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරුවන් විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, නො.44, කැම්බල් පෙදෙස, දෙහිවල දරණ ස්ථානයේ පවත්වාගෙන සොල්බිච් හෝටලය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2022.12.10 දින ලියාපදිංචි පෞද්ගලික සමාගමක් බවත්, ඉහත පැමිණිලිකරුවන් එහි අධ්‍යක්ෂකවරුන් බවත්ය. එකී සමාගම නීත්‍යානුකූලව පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලුම පහත දැක්වෙන බලපත්‍ර ඇතුළු ලියකියවිලි වන,


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.

සභාපති / தவிசாளர் / Chaiman } 011-2505551

ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74

ඊමේල් / மின்னஞ்சல் / Email } sechrcsl@gmai

දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580/81/82

ලේකම් / செயலாளர் / Secretary } 011-2505521

ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996

වෙබ් / இணையம் / Web } www.hresl.lk

(I) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන ආයතනය මගින් නිකුත් කරන ලද බලපත්‍රය

(II) පළාත් ලියාපදිංචි සහතිකය

(III) සංචාරක අවන්හලක් ලෙස ලියාපදිංචි කර ඇති සහතිකය

(IV) 2023/2024 වර්ෂයට අදාල මත්පැන් බලපත්‍රය

(V) 1981 අංක 54 දරණ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ පනත යටතේ, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක CC/P/Gen/2022 සහ 2022.12.19 දිනැති අවසරය.

(VI) භෝජනාගාරයක හෝ ආපනශාලාවක රට බීම විකිණීමේ බලපත්‍රය

(VII) 2023 වර්ෂය සඳහා දෙහිවල/ගල්කිස්ස මහ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙළඳ බලපත්‍රයක් ලබාගෙන ඇති බවත්ය.

එසේ තිබියදී 2024 ජනවාරි 1 වන දින උදෑසන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව, දෙහිවල පොලිසිය, කැරලි මර්දන පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය, ඇතුලු විශාල පොලිස් බල ඇණියක්, බැකෝ යන්ත්‍ර 4ක් සමඟ පැමිණ සෝල් බීච් ආයතනයට සම්පූර්ණයෙන්ම අලාභහානි කර විනාශ කර දමා ඉවත් කල බවත්,

සෝල්බීච් ආයතනය කඩා ඉවත් කරන අවස්ථාවේ දී නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු ඇතුලුව පොලිසිය භාර ඉහළ දේශපාලඥයෙකු පෞද්ගලිකවම හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සහ තවත් පොලිස් නිලධාරීන් 400 ක් පමණ වූ පොලිස් බල ඇණියක් සමඟ විශේෂ උනන්දුවක් දක්වමින් පැමිණිලිකරුවන්ගේ ව්‍යාපාරය විනාශ කර අලාභහනි කිරීමට පෞද්ගලිකවම සහභාගී වූ බවත් , පසුව සොයා බැලීමේ දී දැනගැනීමට ලැබුණේ තවත් මේ හා තරඟකාරී ව්‍යාපාරයක නිරත වන රජයේ උසස් නිලයක් දරණ පුද්ගලයෙකුගේ පෞද්ගලික උවමනාවකට මෙසේ ඔවුන් ක්‍රියා කර ඇති බවත්ය.

තව ද එම අවස්ථාවේ යොදවා ගත් බැකෝ යන්ත්‍ර 04ම අංක වසා දමා තිබුණු බවත් , එම යන්ත්‍ර 04ම කිරුළපන පොලිසිය විසින් සපයා දුන් බවත්, අවුරුදු දෙකකට අධික කාලයක් තිස්සේ මෙම ව්‍යාපාර ස්ථානය ඉදි කිරීමේදී හෝ මාස තුනක කාලයක් මෙම ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේ කාලය තුල දී කිසිදු අවහිරයක් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තුමේන්තුව විසින් සිදු නොකළ අතර හදිස්සියේ පොලිසිය සමඟ එක්ව ද්වේශසහගත ලෙස මෙසේ කටයුතු කර ඇති බවත්, තවද මේ ආකාරයටම වෙනත් හෝටල් හා අවන්හල් එම ස්ථානයේ තිබුනද මෙම ස්ථානය පමණක් ඉවත් කිරීම තුළින් තමාව වෙනස් කොට සලකන බවත් තමා නීත්‍යානුකූලව පවත්වා ගෙන ගිය ව්‍යාපාරය මෙසේ කඩා දැමීම තුළින් තමාට නීත්‍යානුකූල රැකියාවක්, වෙළඳ ව්‍යාපාරයක් කිරීමට ඇති අයිතිය මෙන්ම එම ආයතනයේ සේවය කළ අයවලුන්ටද නිත්‍යානුකූල රැකියාවක යෙදීමේ අයිතිය අහිමි වූ බව හා නීතියේ සර්ව සාධාරණයත්වය නොලැබී ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකාර පාර්ශවයන් වෙතින් වාර්තාවන් කැඳවූ අතර, එකී වාර්තාවන් පදනම් කරගෙන 2024.01.19 දින පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් දෙපාර්තුමේන්තුව :-**

**01 වන වගඋත්තරකරු**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් දෙපාර්තුමේන්තුව විසින් මානව හිමිකම් කොමිෂන් සභාව 2024.01.30 දිනැති යොමුකළ වාර්තාව හා 2024.01.12 දින පැවති පරීක්ෂණයේ දී පහත කරුණු දක්වා ඇත.

1988 අංක 64 හා 2011 අංක 49 දරණ පනත් මඟින් සංශෝධිත 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනතේ 14(i) වගන්තිය අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරිය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් වෙරළ කාලපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක නිරත නොවිය යුතු බවත් එකී නීති ප්‍රතිපාදන කඩ කරමින් අනවසර යම් සංවර්ධන කාර්යයක් සිදු කරන අවස්ථාවේ දී පනතේ 28 (I) වගන්ති ප්‍රකාරව, අදාළ සංවර්ධකයා අත්අඩංගුවට ගෙන දඩුවම ලබා දෙන බවත්, පනතේ 31 වගන්තිය ප්‍රකාරව අනවසර ඉදිකිරීමක් කඩා ඉවත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලතල ඇති බවත්, දක්වා ඇත.

පැමිණිලිකරු දක්වන නො - 44, කැම්බල් පෙදෙස දෙහිවල පිහිටි, මෙම ගොඩනැගිල්ල අනවසර ඉදිකිරීමක් බවත්, එම ඉවත් කිරීම සඳහා මීට පෙර 2022.01.14 දින දෙහිවල පොලිස් ස්ථානයේ අංක CIB (I) 371/130 යටතේ වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරියෙකු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර, ඒ අනුව පී.ඩී.අතපත්තු යන තැනැත්තා අත්අඩංගුවට ගෙන අධිකරණයට 2022.01.27 වන දින ඉදිරිපත් කල බවත් අංක 30045 දරණ නඩු අංක යටතේ නඩුවක් පැවරීමෙන් අනතුරුව චූදිත වරද පිළිගැනීමෙන් රු.25,000ක් දඩයක් අධිකරණය මඟින් නියම කළ බව වැඩිදුරටත් දක්වා ඇත.

පසුව, 2022.02.23 දින අංක DO/2022/17 දරණ කඩා ඉවත් කිරීමේ නිවේදනයක් නිකුත් කළ නමුත් පී.ඩී.අතපත්තු නොනවත්වා ඉදිකිරීම් සිදු කරන ලද බවත්, තවද ආනන්ද අබේකෝන් යන අයවලුන්ද මීට සම්බන්ධ නිසා ඔවුන් දෙදෙනාගේම නමින් අදාළ නිවේදනය නිකුත් කර ඇති බවත් මෙම දෙපාර්තුමේන්තුවේ නිලධාරියෙකු විසින් දෙහිවල පොලිස් ස්ථානය වෙත 2022.03.04 දින අංක EP1B 228/08 යටතේ පැමිණිල්ලක් සිදු කළ බවත් දක්වා ඇත.

තවදුරටත් මෙම වගඋත්තරකාර පාර්ශවය සඳහන් කරනුයේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා තම දෙපාර්තුමේන්තුව විසින් කිසිදු අවසර පත්‍රයක් නිකුත් කර නොමැති බවයි. මෙම දෙපාර්තුමේන්තුව මගින් වෙරළ කලාපය තුළ පිහිටන ඉඩමකට අදාළව පනතේ 14 (I) වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර අදාළ පුද්ගලයාගෙන් අයදුම්පත්‍රයක් ලබා ගන්නා බවත් ඒ සඳහා නියමිත බලපත්‍ර ගාස්තුවක් ද අයකර ගැනිම හා අයදුම්පත්‍රය සමඟ අදාළ බිම් සැලැස්ම හා ගොඩනැගිලි සැලැස්ම ලබා ගන්නා බවත් අදාළ අවසර ලබා දීමේදී එකී ගොඩනැගිලි සැලැස්ම ද දෙපාර්තුමේන්තුවේ මුද්‍රාවක් තබා අදාළ සංවර්ධනයකට ලබා දෙන බවත් එසේ ලබා දෙන ලද පිටපත් අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ද යොමු කරන අතර එකී ආයතනවලින් ද අවසර ලබා ගත යුතු බවට දැනුම් දීමක් කරන බවත් සඳහන් කර ඇති අතර ඉහත සඳහන් පරිදි කිසිදු අයදුම් පත්‍රයක් ලැබී නොමැති බවත්, ඔවුන් වෙත එම දෙපාර්තුමේන්තුව විසින් කිසිදු අවසර පත්‍රයක් ලබා දීමක් හෝ එහි පිටපතක් වෙනත් රාජ්‍ය ආයතනය වෙත යවා නොමැති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

තව ද, "වෙරළ කලාපය" තුළ ඉදිකිරීමක් සඳහා අවසර දෙනු ලැබුව ද, පසුව නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අවසර පත්‍රයක් ලබා ගත යුතු නමුත්, පැමිණිලි ලේඛනයේ සඳහන් කර ඇති ගොඩනැගිල්ලට එවැනි අවසරයක් ලබා දී නොමැති බව ද එම දෙපාර්තුමේන්තුව විසින් අවසර ලබා දීමේ දී වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමණාකරණ සැලැස්ම අනුව අවසර ලබා දීමක් සිදු කරන බවත් ඒ අනුව වැල්ලවත්ත දුම්රිය ස්ථානයේ සිට ගල්කිස්ස හෝටලය දක්වා ඉදිකිරීමේ දී 2018 වර්ෂයේ සිට බල පැවැත්වෙන දුර වන්නේ මීටර් 45 ක් වන අතර එය වෙන්කළ සීමාව වන (ඉදිකිරීමේ තහනම් කලාපය) මීටර් 15 හා සීමා කළ ප්‍රදේශය මීටර් 30 කින් යුක්ත වන බවත් සඳහන් කර ඇත.

එසේ ඉදිකිරීම් සඳහා අවසර ලබා නොදෙන වෙන් කළ සීමාවේ මෙම අනවසර ගොඩනැගිලි ඉදිකර තිබූ බවත්, තම ආයතනය මගින් කිසිදු අවසර පත්‍රයක් නිකුත් කර නොමැති බවත්, එසේ වුව ද එම දෙපාර්තුමේන්තුව විසින් නිකුත් කළා යැයි පවසමින් ලිපියක් දෙහිවල පොලිසිය වෙත පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති බවත්, එම ලිපිය අධ්‍යක්ෂක ජනරාල් විසින් නිකුත් කරන ලද ලිපියක් පිළිබඳව තම ආයතනය වෙතින් ශ්‍රී ලංකා පොලිසිය විමසීමේ දී එම ලිපිය තම ආයතනය නිකුත් නොකළ බව දැක්වීම මත ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ B/28062/24 යටතේ නඩුවක් පවරා අදාළ විමර්ශන කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින බවත් වැඩිදුරටත් දක්වා සිටියි.

තව ද, මෙම අනවසර ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට 2024.01.01 දින දෙපාර්තුමේන්තු නිලධාරීන් විසින් එහි තිබූ භාණ්ඩ ඉවත් කිරීමට , එහි සිටි සේවකයින් වෙත දැනුම් දීමක් කළ බවත් , ඒ අනුව එහි තිබූ භාණ්ඩ වරින් වර ඉවත් කිරීමක් සිදු වූ බවත් , පනතේ 31(3) වගන්තිය ප්‍රකාරව කඩා ඉවත් කිරීමේ බලතල දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇති අතර , ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අධ්‍යක්ෂ (වෙරළ සම්පත් කළමණාකරණ) වෙත 2023.12.29 දින විසින් උපදෙස් ලබා දුන් බවත්, 2024.01.01 දින අදාළ කඩා ඉවත් කිරීම සිදු කිරීම සඳහා තම නිලධාරීන්ට බලය පවරා තිබූ බවත්, මෙම

ආකාරයෙන් යම්කිසි කඩා ඉවත් කිරීමක් සිදු කිරීමට පෙර, එදින අදාළ පොලිස් ස්ථානයෙහි ප්‍රකාශයක් සටහන් කරනු ලබනු අතර , මෙම කඩා ඉවත් කිරීම සිදු කළ දිනය ද, අදාළ කඩා ඉවත් කිරීම සිදු කිරීමට පෙර දෙහිවල පොලිසිය වෙත ප්‍රකාශයක් සටහන් කිරීමෙන් අනතුරුව, පොලිස් ආරක්ෂාව හා සහයෝගය සහිතව එම දෙපාර්තුමේන්තුව විසින් කඩා ඉවත් කිරීමට කටයුතු කළ බවත් කරුණු දක්වා සිටියි. එසේම තම දෙපාර්තුමේන්තුව සතුව ප්‍රමාණවත් පරිදි යන්ත්‍ර සූත්‍ර නොමැති බැවින් මෙම අනවසර ඉවත් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර කුලියට ගැනීමට සිදු වූ බවත්,ඒ සඳහා වැය වූ වියදම් සම්බන්ධ මුදල් කුවිතාන්සි මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන බවත් මීට පෙර ද මෙවැනි අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කර ඇති බවත්, වැඩිදුරටත් දක්වා ඇත.

**<u>02 වගඋත්තරකරු - ස්ථානාධිපති, පොලිස් ස්ථානය, දෙහිවල යන අයගේ කරුණු දැක්වීම :</u>**

2022.01.14 දින වෙරළ සංරක්ෂණ නියාමක සුමුදු රාජපක්ෂ යන අය විසින් දෙහිවල පොලිස් ස්ථානයේ CIB I 371/130 යටතේ 1988 අංක 64 හා 2012 අංක 49 දරණ පනත්වලින් සංශෝධිත 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමණාකරණ පනතේ 28 (1) වගන්තිය යටතේ වරදක් සිදු කර ඇති බව පවසමින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් පාරිසරික අංශයට රාජකාරි කළ උ.පො.ප අධිකාරි හා පො.කො.97329 රණතුංග යන නිලධාරීන් විසින් පුළුල් විමර්ශනයක් කර, අදාළ ස්ථානයේ අනවසර ඉදිකිරීම සිදු කළ, දොන් තුෂාර ධනුෂ්ක අතපත්තු යන අය 2022.01.26 දින අත්අඩංගුවට ගෙන ඉන් පසුදින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට 34005/22 දරණ නඩු අංකයට ඉදිරිපත් කර වරද පිළිගෙන ඇති අතර, රු.25,000 ක දඩ මුදලක් නියම කර ඇති බවත්

ඉන්පසුව ඉහත කී පනතේ 31(2) වගන්තිය යටතේ 2022.02.23 දින , එකී අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කරන ලෙසත්, එසේ කඩා ඉවත් නොකිරීමට හේතු ඇතොත් පනත ප්‍රකාරව දින 03 ක් ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කරන ලෙසත් දන්වා විධානයක් නිකුත් කර ඇති බවත්, ඒ අනුව ජේ.ජේ.ප්‍රභාත් යන අය විසින් වෙරළ සංරක්ෂණ හා පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශයේ ලේකම් එල්.එල්. අනිල් විජේසිරි මහතා වෙත දින 16 කට පසුව අභියාචනයක් යොමු කර ඇති බවත්, මෙම අනවසර ඉදිකිරීම කඩා ඉවත් නොකිරීම සම්බන්ධයෙන් එවකට සිටි දෙහිවල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප දුෂ්මන්ත මහතා විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත සිහි කැඳවීම සිදු කර ඇති බවත් දක්වා ඇත.

2023.12.17 දින ආරම්භ කල යුක්තියේ මෙහෙයුම යටතේ මෙම සෝල් බීච් නමින් පවත්වා ගෙන යන අවන්හල සම්බන්ධයෙන් විමර්ශනයක් සඳහා 2023.12.23 දින බස්නාහිර පළාත් - දක්ෂිණ භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න මාරපන මහතා ගල්කිස්ස කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මංගල දෙහිදෙණිය මහතා සහ දෙහිවල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ඇතුළුව එම ස්ථානයේ ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, එහි අධ්‍යක්ෂවරයෙකු වන සම්පත් අත්තටගේ යන අයගේ ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලද බවත්,

එම අවස්ථාවේ දී ඔහු විසින් වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමණාකරණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අත්සනින් යුතුව CC/P/GEN/2022 දරණ බලපත්‍රයක් ඉදිරිපත් කළ බවත්, තව ද එකී හෝටලය පිහිටි ඉඩම සම්බන්ධයෙන් විමර්ශන කිරීමේ දී සම්පත් අත්තටගේ මහතා විසින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව වෙත රු.2,533,000.00 මුදලක් බදු වශයෙන් ලේඛන ඉදිරිපත් කර බවත්, ඒ සම්බන්ධයෙන් විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති විසින් 2023.12.27 දින දුම්රිය සාමාන්‍යාධිකාරි හමු වී විමර්ශනයක් පැවැත්වීමෙන් අනතුරුව අනාවරණය වී ඇත්තේ දුම්රිය දෙපාර්තුමේන්තුවට අයිතිව තිබූ පර්චස් 6.03 ක ඉඩමක් බවත්, එය මෙතෙක් පරිහරණය කිරීමට කුලිය ලෙස ඉහත කී මුදලක් ගෙවා ඇති බවත්, කිසිදු අවස්ථාවක එම හෝටල් පරිශ්‍රය අසල ඇති දුම්රිය මාර්ගය භාවිතා කර හෝටලය පරිශ්‍රයට ඇතුළු විය නොහැකි බවට දිවුරුම් ප්‍රකාශයක් ද ලබා ගෙන ඇති බවත්ය.

මෙම අනවසර ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට පැහැදිලි නියෝගයක් ලබා දී තිබිය දී 2022.12.10 දින ඉහත සඳහන් අවසර පත්‍රයක් නිකුත් කර ඇති බවට පෙනී ගිය හෙයින් 2023.12.28 දින විමසීමේ දී , අදාළ අවසර පත්‍රයේ යොදා ඇති අත්සන ව්‍යාජ බවත් කිසිසේත්ම එවැනි අවසර පත්‍රයක් වෙරළ සරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තුමේන්තුව විසින් නිකුත් නොකරන ලද බවත්, එකී ලේඛන කූට ලේඛනයක් ද යන්න පරීක්ෂා කරන ලෙස සඳහන් ව තිබූ බැවින් , සම්පත් අත්තටගේ මහතා කැඳවා MOIB 394/82 යටතේ ප්‍රකාශයක් සටහන් කර එකී ලේඛනයේ මුල් පිටපත දේපල කුච්තාන්සි පත් අංක 4483/23 යටතේ ඉදිරිපත් කර ඇති බවත්, පසුව මේ සම්බන්ධව ගල්කිස්ස අධිකරණයේ 28062/204 නඩු අංක යටතේ කරුණු වාර්තා කර අධිකරණ නියෝග පරිදි රස පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇති බවත් දක්වා සිටියි.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂකවරයා වෙත පැවරී ඇති බලතල අනුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ නිලධාරීන් වෙත මෙම ඉදිකිරීම ඉවත් කිරීමට බලය පවරා ඇති අතර ඉන් අනතුරුව එම සහකාර අධ්‍යක්ෂකවරයා විසින් 2024.01.01 දින දෙහිවල පොලිස් ස්ථානය වෙත පැමිණ පොලිස් නිලධාරීන්ගේ සහය හා ආරක්ෂාව ඉල්ලා MOIB 397/01යටතේ පැමිණිල්ලක් සිදු කරන ලද බවත්, ඒ අනුව දෙහිවල පොලිස් ස්ථානය මගින් විමර්ශන සිදු කර අධිකරණ ක්‍රියාමාර්ග නොගන්නා ලෙසට බල කරමින් හා එම අවන්හල කඩා ඉවත් කිරීමට එරෙහිව "දිවියට සවියක්" යන සංවිධානයේ පුද්ගලයන් 300 ක පමණ පිරිසකින් යුතුව උද්ඝෝෂණයකින් යුතුව පැවැත්වීමට සූදානම් කර ඇති බවට බුද්ධි තොරතුරක් ලද බවත්ය.

ඒ අනුව එම උද්ඝෝෂණය හා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුව සඳහා ආරක්ෂාව සැපයීමට , මහජන සාමය කළමනාකරණ කොට්ඨාශයට අනුයුක්ත කළ ජල විදින රථ 01ක් හා පූර්ණ කැරලි මර්දන කණ්ඩායම් 02 ක් සමගින් ගල්කිස්ස කොට්ඨාශයට අනුයුක්ත නිලධාරීන් 137ක් යෙදවීමට නියෝජ්‍ය පොලිස්පතිතුමා වෙතින් ලිපියක් මගින් ඉල්ලුම් කල බවත්ය. ඒ අනුව හා වෙරළ සංරක්ෂණ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් කඩා ඉවත් කිරීමට ක්‍රියා කල බවත්ය. ඒ සඳහා ආරක්ෂාව ගල්කිස්ස කොට්ඨාශයේ පොලිස් ස්ථාන 06 ක මූලිකත්වයෙන් දිස්ත්‍රික්ක භාර

නිලධාරීන්ගේ හා ස්ථානාධිපතිවරුන්ගේ සහභාගිත්වයෙන් සිදු කල අතර රාජකාරියට බාධා කිරීමේ වරද යටතේ 01. සම්පත් අත්තටගේ, 02. මහගේ විශ්ව හින්තක ප්‍රනාන්දු, 03 මිටිමාලගේ නවීන් දිල්හාන් පෙරේරා යන අයවරුන් අත්අඩංගුවට ගෙන 2024.01.02 දින ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක බී 28092/24 යටතේ ඉදිරිපත් කළ බවත්, එම අවස්ථාවේ දී මෙම සෝල් බීච් ආයතනයේ සේවකයින් විසින් හෝටලය ඇතුලත ඇති ආයතනයේ දේපල ද ඉවත් කර ගන්නා ආකාරය,වීඩියෝ ගත කර ඇති බවත්,එසේ එහි තිබූ දේපළ වන වීදුරු භාණ්ඩ,මත්පැන් බෝතල් ආදි භාණ්ඩ එම අවස්ථාවේ ආයනතනයෙන් පිටතට රැගෙන යන ලද සේවකයින් වන සෙල්ලියියා නම්බිරාජ්, වීරසේකර මුදියනසේලාගේ නවිදු නිමේෂ් ප්‍රේමසිරි යන අයගේ ප්‍රකාශ සටහන් කර බවත්,එම අවස්ථාවට රැගෙනවිත් තිබූ JCB රථ රියදුරන් හට ද සම්පත් ඇතුළු පිරිස විසින් බාධා කිරීමක් සිදු කළ බවත්, එම රියදුරුගෙන් ද ප්‍රකාශයක් ලබා ගන්නා ලද බවත්,ඉහත සඳහන් අනවසර ඉදිකිරීමට මුදල් යෙදවීම සම්බන්ධයෙන් නීති විරෝධි වත්කම් හා දේපල විමර්ශන කොට්ඨාශය මඟින් කොළඹ මහාධිකරණ නඩු අංක SPL14/2022 යටතේ කරුණු වාර්තා කරමින් 2005 අංක 06 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ මූලික විමර්ශනයක් සිදු වෙමින් පවතින බවත්,මෙසේ කඩා ඉවත් කිරීමෙන් පසු එම ආයතනයේ අධ්‍යක්ෂවරුන් සමාජ මාධ්‍ය හරහා ශ්‍රී ලංකා පොලිසියේ කීර්තිනාමයට කැළැලක් වන අයුරින් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති බවත් වැඩිදුරටත් දක්වා සිටියි.

**03 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

2022.01.19 වන දින වෙරළ සංරක්ෂක නියාමකවරයෙකු පැමිණිල්ලක් සිදුකරන බවත් ඊට අදාළව ම/උ 30045 යටතේ අධිකරණයට ඉදිරිපත් කළ බවත් ඒ අවස්ථාවේදි මෙම ප්‍රශ්න ගත හෝටලය අයිතිව පැවතුනේ ධනුෂ්ක අතපත්තුට බවත්,

පසුව මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා අතපත්තු නැමැති පුද්ගලයාට නියෝගයක් නිකුත් කර ඇති බවත් නමුත් එම නියෝගය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2022.03.27 දින වෙරළ සංරක්ෂන අධ්‍යක්ෂ ජනරාල් වෙත එවකට දෙහිවල ස්ථානාධිපති විසින් ලිපියකින් දන්වා යවන බවත් පසුව ප්‍රභාත් යන පුද්ගලයෙකු අභියාචනයක් අමාත්‍යාවරයාට සිදුකර ඇති බවත් ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් නොවන කෙනෙක් බවත්, අධ්‍යාක්ෂක මණ්ඩලයේ සම්පත් අත්තටගේ යන අයට ලිපියකින් අවසර දී ඇති බවට දන්වා ඇති බවත් මේ වන විට සොල් බිච් ආයතනය පර්ල් බිච් ආයතනය සම්බන්ධයෙන් මුලා වංචා ඇති බවත් මේ පිළිබදව අනායාකාරයෙන් මුදල් ඉපයිම පිළිබඳ විමර්ශන සිදුවන බවත් මෙම භූමිය පැවරුම් සිදු කල ආකාරය සම්බන්ධයෙන් හා මත්ද්‍රව්‍ය ජාවාරම පිළිබඳ බුද්ධි තොරතුරු මත විමර්ශන සිදුකරන බවත් දක්වා ඇත.

04 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

- දෙහිවල පොලිස් ස්ථානය වෙත 2022.01.14 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව විසින් නො 44, කැම්බල් පෙදෙස, දෙහිවල ලිපිනයේ අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් පැමිණිලි කළ බවත් එකී පැමිණිල්ලේ විමර්ශන කටයුතු සිදුකිරීමෙන් පසුව ඩී.ටී.ඩී.අතපත්තු යන අය අත්අඩංගුවට ගෙන ගල්කිස්ස ම/උ 300045 අධිකරණයට ඉදිරිපත් කර රු.25000/- දඩයකට යටත්ව මුදාහල බවයි.

- වෙරළ සංරක්ෂන හා වෙරළ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වෙරළ සංරක්ෂන හා වෙරළ සම්පත් කළමණාකරණ පනතේ 31(2) අනුව අනවසර ඉදිකිරීම කඩා ඉවත් කිරීමට නියෝග ලබාදුන්නද එකී නියෝග නොසලකා හරිමින් විවිධ ඉදිරිකිරීම් සිදුකර ඇති බවත්,

- 2023.12.07 දින ආරම්භ කරන ලද " යුක්තිය"මෙහෙයුමට අදාළව ලද තොරතුරක් මත ගල්කිස්ස කොට්ඨාශ භාර නිලධාරි ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරි මංගල දෙහිදෙණිය මහතා විසින් ස්ථානාධිපති - දෙහිවල වෙත අදාළ ස්ථානය පරීක්ෂා කිරීමට උපදෙස් ලබාදී ඇති අතර, අදාළ ස්ථානය පරීක්ෂා කිරීමේදි එකී ඉදිකිරීම් සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් අවසර පතක් ඉදිරිපත් කර ඇති නමුත් සම්පත් අත්තටගේ යන අය ඉදිරිපත් කර ඇති අවසර පත ව්‍යාජ ලේඛනයක් බවට කරුණු අනාවරණය වී ඇති බවත් දක්වා ඇත.

- ඒ අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ගල්කිස්සගේ අධීක්ෂණය යටතේ අංක IR 213/2023 එකී පැමිණිල්ල ලේඛනගත කර ඇති අතර. නීති විරෝධීව ඉදිකරන ලද ගොඩනැගිල්ල 2024.01.01 දින කඩා ඉවත් කිරීමට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් ලිඛිත නියෝග මොරටුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ප්‍රාදේශීය ඉංජිනේරු සහ සහකාර අධ්‍යක්ෂවරයා වෙත අංක CPP/GEN/CZOD/67/2024 යටතේ ලබාදී ඇත. ඒ අනුව දෙහිවල පොලිස් ස්ථානය වෙත ආරක්ෂක සහාය ලබාදෙන ලෙසට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

- එසේම අදාළ ස්ථානයේ සොල් බිච් හෝටලයේ කළමණාකරු සම්පත් අත්තටගේ යන අයගේ ප්‍රධානත්වයෙන් උද්ඝෝෂණයක් පැවැත්වෙන බවට බුද්ධි තොරතුරු අනාවරණය වීම මත හදිසි අවස්ථාවකදි කැදවීම සඳහා ජල විදින රථයක් සමග කැරලි මර්ධන කණ්ඩායම් 02 ක් ද ලබාගැනීමට කටයුතු කළ අතර, ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කරමින් වෙරළ සංරක්ෂණ සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරින් අනවසර ඉදිකිරීම කඩා ඉවත් කිරීමට ක්‍රියා කරන ලද අතර, ඒ සඳහා සහායට පැමිණි බැකෝ යන්ත්‍ර ක්‍රියාකරුට හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට රාජකාරි කටයුතු සඳහා බාධා කරන ලද පුද්ගලයින් 04 දෙනෙක් අත්අඩංගුවට ගෙන ගල්කිස්ස මා/උ බි 28092/24 යටතේ අධිකරණයට ඉදිරිපත් කිරිමෙනේ අනතුරුව ශරීර ඇප මත මුදාහැර ඇත.

- දැනට මෙම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩය සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාශය විසින් විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියි.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ 2024.01.19 දිනැති ස්ථානීය පරීක්ෂණයේ නිරීක්ෂණ :-**

- ප්‍රශ්න ගත සොල්බිච් (පෞද්ගලික) සමාගම දුම්රිය මාර්ගයේ සිට වෙරළ පැත්තට මීටර් 3 කට ආසන්න පරතරයකින් පිහිටා ඇති බවත් එම ආයතනයේ සාදා තිබූ පිවිසුම් මාර්ගයක් සඳහා දුම්රිය මාර්ගයට මීටරයක් පමණ ආසන්නයේ පඩිපෙලක් හා සිමෙන්ති ගල් ඇතිරූ කොටසක්ද තිබුනු බවටත් මෙම ආයතනය දකුණු පැත්තේ Sunset ආයතනය සහ වම්පැත්තට Deck Family Restaurant යන ආයතනය දෙකට අතර බවත් එම ආයතන දෙක පැමිණිල්ලේ සඳහන් කඩා ඉවත් කරන ලද ආයතනය පිහිටා තිබෙන එම සීමාව තුලම පිහිටා ඇති බවත් පැහැදිලිව නිරීක්ෂණය වී ඇත.

- තවද මෙම හෝටලයේ සෝල්බීච් මුහුනත පිහිටා තිබෙන්නේ දුම්රිය මාර්ගයට වන අතර, දුම්රිය රක්ෂිතව තුළ සාදා තිබූ මෙම හෝටලයට අයත් කොටස්ද කඩා දමා ඇති බවටත් එසේ කඩා ඉවත් කර තිබූ වැඩි ප්‍රමාණයක් දුම්රිය රක්ෂිතය තුළ පිහිටා තිබූ ගොඩනැගිලි කොටසක් වන බවට නිරීක්ෂණය කරන ලදී.

- වෙරළට අදාළ පැති නිරීක්ෂණය කිරීමේදී වෙරළ කලාපයේ මීටර් 15 ක සීමා තහනම් කලාපයක් බවත් එකී සීමාව තුළදී කිසිදු ඉදිකිරීමක් සිදුකළ නොහැකි බව හා මීටර් 30 ක් දක්වා සීමාව තුළදී උපදේශන සභාවේ අනුමැතිය ඇතුව ඉදි කළ හැකි බවත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවෙන් සහභාගි වූ නිලධාරීන් විසින් දැනුම් දුන් බවත් ඔවුන් විසින් පෙන්වා සිටි තහනම් කලාපය පටන් ගන්නා මීටර් 15 ක ස්ථානය ස්වාභාවික වෘක්ෂලතා තිබෙන ස්ථානයක් වන අතර, කඩා ඉවත් කරන ලද ගොඩනැගිල්ල වෙරළ පැත්තට වැටකෙයියා පදුරක් පිහිටා තිබූ අතර, එතැන් සිට දුම්රිය මාර්ගයට මීටර් 15 ක දුරක් පරීක්ෂා කරන ලදී.

- ඒ අනුව කඩා ඉවත් කරන ලද ගොඩනැගිල්ල මීටර් 15 සීමාව තුළ පවතින බවට නිරීක්ෂණය වූ අතර, අදාළ ආයතනයේ දෙපස තිබූ ආයතන තහනම් කලාපය තුළ පිහිටා ඇති බවත් එම ගොඩනැගිලි වලට අමතරව Sunset ආයතනය පිහිටි පැත්තේ තවත් ගොඩනැගිලි කිහිපයක් දක්නට ලැබුනු අතර, Sunset ආයතනයට යාබදව නව ස්ථිර ගොඩනැගිල්ලක් අත්තිවාරම දමා බිම් මහල සාදා ඇති බවත් එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.

- වෙරළ සංරක්ෂණ දෙපාර්තමේතුව විසින් දන්වා සිටින ලද්දේ මොරටුව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය විසින් සකස් කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාව පදනම් කරගෙන මෙම කඩා ඉවත් කිරීම සිදුකළ බවයි. එසේ මෙම බිම් ප්‍රදේශයේ පවතින හොටල් ආයතන සමඟ සැසදීමේදි වඩා වැඩි ඉඩක් සමග පිහිනුම් තටාකයක් සහිත වඩාත් සංවර්ධනය කරන ලද හෝටලය මෙය බවද නිරීක්ෂණය වු අතර, දුම්රිය මාර්ගයට ආසන්නයේ තිබු ඉදිකිරීම් කඩා දමා ඇති බවත් හෝටලයේ වම්පස ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර ඇති බවද නිරීක්ෂණය විය.

නිරීක්ෂණ :-

- පැමිණිලි පාර්ශවය මුලිකව කොමිෂන් සභාවේ පැමිණිලිකරමින් දක්වා සිටිනුයේ නිත්‍යානුකුල ලෙස පවත්වාගෙන ගිය ව්‍යාපාරික ස්ථානය වගඋත්තරකාර පාර්ශවයන් විසින් අනිතිකව අත්තනෝමතිකව ඉවත් කිරිම හේතුවෙන් තම මුලික අයිතිවාසිකම් කඩ විම් වු බවයි.

- ඒ අනුව අදාළ හෝටලය ඉවත් කිරිම පිළිබඳ වු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදි

- මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුවන් විසින් අවුරුදු 05 ක බදු පදනම මත මෙම සෝල්බීච් හෝටලය අබ්දුල් රාෂික් මොහොමඩ් බාෂික් වෙතින් 2023.01.01 සිට 2027.02.28 දක්වා කාලයට අදාලව බදු පදනම ලබාගෙන ඇති බව හා පැමිණිලිකාර පාර්ශවයන් අතර එකඟතා ගිවිසුම් අනුව මෙම ව්‍යාපාරය හා සම්බන්ධ වි ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

- එහිදි පැමිණිලිකාර පාර්ශවය දක්වනුයේ අදාළ සියලු අනුමැතියන් ලබාගෙන මෙම ව්‍යාපාරය එම ස්ථානයේ නිත්‍යානුකුලව සිදුකළ බවත් ඒ සඳහා ඉදිකිරීම් සඳහා අවශ්‍ය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 14(1) වගන්තිය යටතේ වු CC/P/GEN/2022 අංක දරණ 2022.12.19 දිනැති අවසර පත්‍රය තමන් සතුව තිබුනු බවත් තවද දුම්රිය දෙපාර්තමේන්තුව වෙතින්ද දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පර්චස් 6.5 කොටසක්ද බදු ලෙස ලබාගෙන තිබුණු බවත්ය. ඒ අනුව අදාළ ලේඛන පිළිබඳ අවධානය යොමු කිරීමේදි පහත අදාළ ලේඛන පැමිණිලිකරු සතුව ඇති බව නිරීක්ෂණ වේ.

  I. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන ආයතනය මගින් නිකුත් කරන ලද බලපත්‍රය
  II. පළාත් ලියාපදිංචි සහතිකය
  III. සංචාරක අවන්හලක් ලෙස ලියාපදිංචි කර ඇති සහතිකය
  IV. 2023/2024 වර්ෂයට අදාල මත්පැන් බලපත්‍රය

V. 1981 අංක 54 දරණ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ පනත යටතේ, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක CC/P/Gen/2022 සහ 2022.12.19 දිනැති අවසරය.

VI. භෝජනාගාරයක හෝ ආපනශාලාවක රට බීම විකිණීමේ බලපත්‍රය

- තවද පැමිණිලිකරු සඳහන් කරන CC/P/GEN/2022 ලේඛනය නිකුත් කිරීමට ප්‍රථම පැමිණිලිකරුවෙකු වන සම්පත් අත්තටගේ යන අය නිවාස හා ඉදිකිරීම් රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු අමාත්‍යවරයා වෙතින් මෙම ඉදිකිරීම සඳහා විරුද්ධතාවයක් නොමැති බවට ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇතිබව නිරීක්ෂණය වේ. එම ලිපියට "රණවක මහතා අධ්‍යක්ෂ ජනරාල් මේ අයට අවශ්‍ය කටයුත්ත කර දෙන්න " ලෙසට අමාත්‍යවරයා සටහන් යොදා ඇති බවද එම ලිපිය අනුව නිරීක්ෂණය වේ.

- මෙහිදි වගඋත්තරකාර පාර්ශවයන් කරුණු දක්වනුයේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අනුමැතිය ලබාදුන් බවට දක්වන CC/P/Gen/2022 ලේඛනය ව්‍යාජ ලේඛනයක් වන බවත් ඒ අනුව 01 වන වගඋත්තරකාර පාර්ශවයේ දැන්වීම මත ඒ පිළිබඳ අධිකරණයට කරුණු ඉදිරිපත් කර මේ වනවිට එම ලේඛනයේ සත්‍යතාවය පරීක්ෂා කිරීමට රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත්ය.

- මෙහිදී 1981 අංක 51 දරණ වෙරළ සංරක්ෂණ පනතේ අවසර පත්‍ර පිළිබඳ කාර්යය පටිපාටිය පිළිබඳ සැලකීමේදි ,

I 14(1) අධ්‍යක්ෂවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් වෙරළ කළාපයක සංවර්ධන කාර්යය නිරත නොවිය යුතු බව දන්වා ඇත.

II 14(3) වෙරළ කළාපය ඇතුලත යම් සංවර්ධන කාර්යයක නිරත වීමට අවසර පත්‍රයක් සඳහා වු ඉල්ලීමක් නියමිත ආකාරයට අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එවැනි හැම ඉල්ලීමක්ම නියමිත ආකෘතියට අනුව විය යුතු අතර, නියමිත විස්තර එහි ඇතුලත් විය යුතුය. තවද නියමිත ගාස්තුව ඒ සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

- ඒ අනුව උක්ත ක්‍රියාපටිපාටිය තුළ පැමිණිලිකාර පාර්ශවය දක්වන අවසර ලබාදුන් ලිපිය නිකුත් වුවාද යන්න කරුණු විමසීමේදි 01 වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටිනුයේ මෙම ඉදිකිරිම සම්බන්ධව

ඉහත පනත ප්‍රකාරව නියමිත ක්‍රමවේදය තුළ ඉල්ලීම් කිරීමක් සිදුකර නොමැති බවත් තමා CC/P/GEN/2022 අංක දරණ 2022.12.19 දිනැති නිකුත් කළ බව දක්වන ලිපිය හා අත්සන ව්‍යාජ බවත්ය. ඒ අනුව මෙම අවසර පතේ සත්‍යතාවය පිළිබඳව 2024.01.01 දින අධිකරණයට කරුණු වාර්තා කර මේ වන විට රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව කරුණු නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම අවසර පත පිළිබඳ විමර්ශනය කරමින් පැවැතිමේදි එය නිවැරදි හෝ ව්‍යාජ එකක්ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව මෙම ගොඩනැගිල්ල ඉවත් කිරීම සිදුකර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

මීලගට කොමිෂන් සභාව අවධානය යොමු කරනු ලබනුයේ ඉදිකිරීමක් ඉවත්කිරීම සම්බන්ධව ඇති ප්‍රතිපාදන මත පිහිටා 01 වන වගඋත්තරකාර පාර්ශවය කටයුතු කරාද යන්න හා 02, 03, 04, 05 වගඋත්තරකරුවන් මෙම ඉවත් කිරීමට අදාළව අනිතිකව හා තමාට පැවරි ඇති බලතල වලට අදාළ නොවන කටයුතු කිරීමක් සිදුකරාද යන්නයි.

1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනතේ 31(1) වගන්තිය යටතේ දක්වා ඇත්තේ වෙරළ කලාපය තුළ කිසිදු අභ්‍යන්තර ඉදිකිරීමක් නොකල යුතු බවත් 31(1) අනවසරයෙන් කරන ලද කිසියම් ඉදිකිරීමක් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ගොඩනැගිමට හෝ නොකරනු ලැබිය යුතු බවයි.

31(2) දක්වනුයේ එම ඉදිකිරීමේ දැන්වීමක් ඇලවීමෙන් අවස්ථානෝචිත පරිදි අයිතිකරු හෝ පදිංචිකරු වෙත කරනු ලබන දැනුම්දීමක් මගින් අධ්‍යක්ෂවරයා විසින්යම් කාලයක් ඇතුලත එය බිද හෙලන ලෙස අයිතිකරුට හෝ පදිංචිකරුට විධානය කළ යුතු බවයි.

13(3) එම විධානයේ අතෘප්තියට පත් තැනැත්තා ඒ පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත දින තුනකදි අභියාචනා කළ හැක.

13(4) දැන්වීමෙහි සඳහන් කාලය ඇතුලත හෝ අභියාචනා ප්‍රතික්ෂේප කළ විට එම ගොඩනැගිල්ල බිද හෙලා ඉවත් කළ යුතු බව දක්වා ඇත.

පැමිණිලිකාර පාර්ශවය මෙහිදි දක්වනුයේ මෙම ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන ගිය තමන් හට කිසිදු අවස්ථාවක එවැනි විධානයක් නොලැබුනු බවත් එම ක්‍රියාදාමය අනුගමනය කිරීමට අවස්ථාවක් ලබා නොදි අත්තනෝමතිකව කටයුතු කළ බවයි.

මෙම කඩා ඉවත් කිරීම පිළිබඳ 01 වන වගඋත්තරකාර පාර්ශවය දක්වනුයේ 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ පනතේ 31 වගන්තිය යටතේ මෙම ස්ථානයේ අනවසර ඉදිකිරීමක් කර තිබුනු හෙයින් මීට පෙර එය ඉවත් කිරීමට විධානයක් නිකුත් කර තිබීම මත ගොඩනැගිල්ල කඩා ඉවත් කළ බවයි.

තවද මේ සැබැදිව 01 වගඋත්තරකාර පාර්ශවය අනුව දක්වනුයේ නො - 144, කැම්බල් පෙදෙස, දෙහිවල යන ස්ථානයේ ඉදිකිරීම පිළිබඳව තුෂාර ධනුෂ්ක අතපත්තු හා ආනන්ද අබේකොන් නැමැත්තාට 2022.02.23 දිනැතිව විධානයක් නිකුත් කළ බවත් 2023.01.27 දින තුෂාර අතපත්තු යන අය පනතේ 14 වගන්තිය මත අත්අඩංගුවට ගෙන වරද පිළිගෙන රු.25,000/- ක දඩයක් ගෙවූ බවත්ය.

ඒ අනුව 01 වන වගඋත්තර පාර්ශවය දක්වන 2022.02.23 නිකුත් කළ විධානය අදාළ වනුයේ තුෂාර ධනුෂ්ක අතපත්තු හා ආනන්ද අබේරත්න යන අයවලුන්ට බව නිරීක්ෂණය වන අතරම එම විධානය දැනට එම ගොඩනැගිල්ලේ පදිංචිව ව්‍යාපාරය සිදුකරනු ලබන පැමිණිලිකරුවන් හෝ අයිතිකරුගේ නමින් හෝ මෙම ඉවත් කිරීමට ප්‍රථම දැනුම්දීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව 2024.01.01 දින කඩා ඉවත් කිරීමට ප්‍රථම, මෙම ගොඩනැගිල්ල තුළ ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන හෝ අයිතිකරු කවුදැයි හඳුනාගෙන විධානයක් නිකුත් කර නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය පනත ප්‍රකාරව කටයුතු කර නොමැති බවට මානව හිමිකම් කොමිෂන් සභාවේ අවධානයට ලක්වේ.

තවද 01 වන වගඋත්තරකාර පාර්ශවයට අනුව 2022.02.23 විධානයක් සිදුකළ බව දක්වා ඇති බැවින් පනතේ 31(3) 31(4) යටතේ කටයුතු කිරීමට අවුරුද්දකුත් මාස 10 ක කාලයක එනම් 2024.01.01 දින වනතුරු එම කඩා ඉවත් කිරීමට කටයුතු නොකිරීම හා ඉතාමත් කෙටි කාලයකදී කඩිනමින් මෙම ඉවත් කිරීම සිදු කිරීමේ අවශ්‍යතාවය කෙරේ අවධානය යොමු කිරීමේදී පහත කරුණු නිරීක්ෂණ වේ.

2024.01.19 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී 01 වන වගඋත්තරකරු වෙතින්, 01 වන වගඋත්තරකරු දක්වන 2022.02.23 විධානයෙන් වසර 01 මාස 10 කට පසු කඩා ඉවත් කිරීම සිදු කිරීමට හේතු විමසා සිටීමේදී, 1 වන වගඋත්තරකරු දක්වා සිටියේ, එම කඩා ඉවත් කිරීම සිදුකිරීමේදී රජයේ නිලධාරියෙකු ලෙස තමාට දේශපාලන වශයෙන් සමහර නිලධාරීන්ගෙන් බලපෑම් එල්ල වීම හේතුවෙන් මෙය කඩා ඉවත් කිරීම සිදු කිරීමට නොහැකි වූ බවත් එසේම පොලිසියෙන් මෙම කඩා ඉවත් කිරීම නොකරන්නේ මන්දැයි විමසීමක් කළ බැවින් එම කඩා ඉවත් කිරීම 2024.01.01 දින සිදුකළ බවටත් හේතු දක්වා ඇත.

එසේම 2022.12.19 දාතමින් 01 වන වගඋත්තරකරු විසින් අධ්‍යක්ෂ සම්පත් කළමණාකරන වෙත මෙම කඩා ඉවත් කිරීමේ නියෝගය CDO/2022/17 ශීර්ෂය යටතේ යවනු ලබන ලිපියට අවධානය යොමු කිරීමේදී "උක්ත නියෝගය ප්‍රකාරව ඉහත අනවසර ඉදිකිරීම කඩා ඉවත් කර නොමැති බව දෙහිවල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සහ තවත් පොලිස් නිලධාරීන් 2023.12.23 දින මා හමුවේ ප්‍රකාශ කර සිටින ලදී." "මෙම අනවසර ඉදිකිරීම පිළිබඳව 2023.12.28 දින ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාද මා වෙතින් විමසීම් කරන ලදී." ලෙස දක්වා ඇත.

ඒ අනුව 01 වන වගඋත්තරකරුට මෙම ඉදිකිරීම අනවසර බවත් එය ඉවත් කළ යුතු බවටත් (02 වන වගඋත්තරකරු, ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් හා මහජන ආරක්ෂක ඇමතිවරයා මතක් කරදීමෙන් කළ පසු ඒ සඳහා 01 වන වගඋත්තරකරු කටයුතු කල බවට කරුණු තහවුරු වේ.

01 වගඋත්තරකරු අනවසර යැයි දක්වනු ලබන කොටස කඩා ඉවත් කිරීමට දේශපාලන වශයෙන් එන බලපෑම් මත ප්‍රමාද සිදුකිරීම් කර ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ඉවත් කිරීමට ද එවැනි බලපෑමක් හේතු වූ බවට කරුණු ඉහත ප්‍රකාශ මගින් තහවුරු වේ.

ඒ අනුව රාජ්‍ය නිලධාරියෙකු ලෙස 01 වන වගඋත්තරකරු තමාට පැවරි ඇති වගකීම ඉටු කිරීම යම් බලපෑම් මත හෝ වෙනත් පාර්ශවයකගේ විමසීම මත සිදුකිරීම තුළින් තම වගකීම නිසියාකාරව සිදුකරනවාද යන්න පිළිබඳ ප්‍රශ්නගත වනවා මෙන්ම සිවිල් ජනතාවට සාධාරණ සේවයක් ලැබෙනවාද යන ගැටලුව මෙහිදී මතුවේ.

තව ද, වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම හෝටලය සඳහා විවිධ ප්‍රසංග පැවැත්වීම සඳහා අවසර ලබා දී ඇති බව 2023 දෙසැම්බර් 09 වන දින සංවිධානය කරන ලද "Last of us" ප්‍රසංගය සඳහා විරුද්ධතාවයක් නොමැති බවට 2023.12.01 දිනැතිව CCD/M/CRMDS/ Dehiwala/06 ලිපිය මගින් අනුමැතිය ලබා දීමෙන් තහවුරු වේ. මේ අනුව ඒ වන විටත් මෙම ගොඩනැගිල්ල අනවසර බවට හෝ කඩා ඉවත් කළ යුතු බවට කිසිදු අවශ්‍යතාවයක් 01වන වගඋත්තරකාර පාර්ශවයට නොතිබුණු බවට නිරීක්ෂණය වේ.

මීලගට පොලිසිය මෙම කඩා ඉවත් කිරීම සම්බන්ධව ද්වේශසහගත ලෙස හා අත්තනෝමතික ලෙස මැදිහත්වීමක් සිදු කලද යන කාරණය පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමේදී 2024.01.12 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට 04 වන වගඋත්තරකාර පාර්ශවය යොමුකළ වාර්තාවට අනුව 2023.12.17 දින දිවයිනම අවරණය වන පරිදි ආරම්භ කරන ලද "යුක්තිය මෙහෙයුමට" අදාළව 2023.12.19 වන දින ලද විශ්වාසදායක තොරතුරකට අනුව මෙම ස්ථානයේ බලපත්‍ර පරීක්ෂාවක් සිදුකරන ලෙසට ගල්කිස්ස කොට්ඨාශ භාර නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙණිය මහතාට හා ස්ථානාධිපති දෙහිවල යන අයට උපදෙස් ලබාදුන් බවත් දක්වා ඇත. එසේම 02 වන වගඋත්තරකරුගේ 2024.01.28 දිනැති වාර්තාවට අනුව නියෝජ්‍ය පොලිස්පති යසන්ත මාරසිංහ මයා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මංගල දෙහිදෙනිය හා තමා එම ස්ථානයේ ස්ථානීය පරීක්ෂණයක් කර සෝල්බිච් හෝටලයේ අධ්‍යක්ෂ සම්පත් අත්තටගේ යන අයගේ ප්‍රකාශ සටහන් කළ බවට කරුණු දක්වා ඇත.

ඒ අනුව 2023.12.19 දින යුක්තිය මෙහෙයුමට ලද තොරතුර මත මෙම ප්‍රශ්නගත ස්ථානය වන සෝල්බිච් හෝටලයේ බලපත්‍ර පරීක්ෂාව පිළිබඳව මැදිහත්වී ඇති බවට වගඋත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් පිළිගෙන ඇත.

එසේම ලද විශ්වාසනිය තොරතුර කුමක්ද යන්න වග හෝ එම තොරතුර සාධාරණිය තොරතුරක් ද යන්න තහවුරු කරගත් බවට වගඋත්තරකාර පාර්ශවය කරුණු දැක්විමට සමත්වි නොමැති බවට අදාළ ලේඛන හා 02, 03, 04 වගඋත්තරකාර පාර්ශවයේ කරුනු දැක්වීම අනුව නිරික්ෂණය වේ.

එසේම යුක්තියේ මෙහෙයුමේ ප්‍රධාන අරමුණ වුයේ මත්ද්‍රව්‍ය ජාවාරම හා සමුහ අපරාධ මැඩ පවැත්විම වන අතර ඒ සඳහා බලපත්‍ර පරික්ෂාව හා අවසර පත් පරික්ෂාවක් ඇතුලත් විම ප්‍රශ්නගත වේ.

තවද මෙවැනි අනවසර ඉවත් කිරිමක් සිදුකිරිමේදි පොලිස් නිලධාරින්ට අයත් කාර්ය භාරය වනුයේ අදාළ ආරක්ෂාව ඉල්ලීම් කිරිමේදි එම අවශ්‍යතාවය සපුරාලිම බව මානව හිමිකම් කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

එහෙත් මෙම ඉවත් කිරීම සඳහා බැකෝ යන්ත්‍ර කැදවීම් ආදිය කටයුතු වෙරළ සංරක්ෂන දෙපාර්තමේන්තුව සිදුකළ යුතු වුවද එම කටයුතු සිදුකර ඇත්තේ පොලිස් දෙපාර්තමේන්තුව විසින් බවද පහත ප්‍රකාශය අනුව තහවුරු වේ.

බැකෝ යන්ත්‍ර රියදුරු වන මනිවෙල් විරංක සංජිව යන අය 2024.01.01 දින පොලිස් ස්ථානයේ MOIB 16/13 යටතේ ලබාදි අති ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කිරිමේ දි "2023.12.31 දින සවස වැඩ කරන කොට බොස් කිව්වා මට තව පොලිසියේ වැඩක් තියෙනවා එකට යන්න ලැස්ති වෙන්න කියලා ඒ අනුව අද දින උදේ දෙහිවල සෝල්බ්‍රිච් එකට ආවා පොලිසියේ ලොකු මහත්තුරු මට ගොඩනැගිල්ලක් පෙන්නලා කඩන්න කියලා කිව්වා" ලෙස ප්‍රකාශ ලබා දී ඇති බවට කරුණු නිරික්ෂණය වේ. එසේම 01 වන වගඋත්තරකාර පාර්ශවයට අදාළ බැකෝ යන්ත්‍ර කැඳවීම් කිරීම් ලේඛනය ඉදිරිපත් කිරිමට මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැති පරික්ෂණයේ දී දැනුම් දුන්න ද එවැනි ලේඛනය ඉදිරිපත් කිරිමට 01 වන වගඋත්තර පාර්ශවය සමත්ව නැති අතර කුවින්තාන්සියක් පමණක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම බැකෝ යන්ත්‍ර කැඳවීම පොලිසිය විසින් කළ බවට තවදුරටත් කරුණු තහවුරු වේ.

ඒ අනුව ඉහත ඉවත් කිරිම සඳහා පූර්ව කටයුතු වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව නොව පොලිස් දෙපාර්තමේන්තුව විසින් සිදුකර ඇති බවට කරුණු නිරික්ෂණය වන අතරම එම ඉවත් කළයුතු කොටස පෙන්විමද පොලිස් දෙපාර්තමේන්තු නිලධාරින් පෙන්වා ඇති බවට එමගින් කරුණු නිරික්ෂණය වේ.

එසේම පැමිණිලිකාර පාර්ශවයට අනුව මෙම කඩා ඉවත් කිරිම සඳහා විශාල පොලිස් බල ඇනියක් හා පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරින් විශාල පිරිසක් පැමිණි බවට කරුණු දක්වා ඇත.

ඒ අනුව 01 වන වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව 2024.01.01 දින සොල්බ්ච් හෝටලය ඉවත් කිරීම හා සොල්බ්ච් අවන්හලට විරුද්ධව දෙහිවල පොලිස් ස්ථානය මගින් සිදුකරන විමර්ශනය සඳහා අධිකරණ ක්‍රියා මාර්ග නොගන්නා ලෙස ඉල්ලමින් ඒ පිළිබඳ විරෝධතාවයක් පැවැත්වීමට නියමිත බවට බුද්ධි අංශ ලබාදුන් තොරතුර මත නියෝජ්‍ය පොලිස්පති විසින් මහජන සාමය කළමණාකරණ කොට්ඨාශය අනුයුක්ත ජල විදින රථ 01 ක් හා පූර්ණ කැරලි මර්ධන කණ්ඩායම් 02 ක් කැඳවූ බව දක්වා ඇත. එසේම ඒ සඳහා නියෝජ්‍ය පොලිස්පති 01 හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි 02 හා පොලිස් අධිකාරි 02 ඇතුලුව නිලධාරින් 137 ක් සහභාගිවූ බවට 2 වන වගඋත්තරකරු ලබාදුන් ලේඛන අනුව කරුණු නිරීක්ෂණය වේ.

2024.01.01 විරෝධතාවයක් පවතින බවට 2023.12.28 දින ලද බුද්ධි තොරතුර කෙරෙහි අවධානය යොමු කිරීමේදි එම තොරතුර ලැබී ඇත්තේ " දෙහිවල පොලිසිය ඉදිරිපිට සම්පත් අත්තටගේ යන අය සංවිධානය කරන 300 පිරිසකගේ සහභාගීත්වයෙන් දෙහිවල පොලිස් වසමේ මුහුදු බඩ මාර්ගයේ පිහිටි සොල් බ්ච් අවන්හලට විරුද්ධව දෙහිවල පොලිස් ස්ථානය මගින් විමර්ශන සිදුකරන අධිකරණ ක්‍රියාමාර්ග නොගන්නා ලෙසට බල කරමින් එම අවන්හල කඩා ඉවත් කිරීමට එරෙහිව උද්ඝෝෂණ පැවැත්වීමට නියමිත බවයි.

එසේවුවද මෙම කඩා ඉවත් කිරීමට බලය පැවරීම 1 වන වගඋත්තරකාර පාර්ශවය විසින් සිදුකර ඇත්තේ 2024.01.01 දින බවට ලේඛන හා 01 වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම අනුව තහවුරුවී ඇත. කඩා ඉවත් කිරීමට විධානයක් 2024.01.01 ට පෙර නිකුත් කර නොතිබිය දී, නිකුත් නොකළ විධානයකට එරෙහිව මෙවැනි උද්ඝෝෂණයක් ඇති බවට තොරතුරක් ලැබුනු බවට දක්වන කරුණු ප්‍රශ්න සහගත වේ. එසේම 02 වන වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට ලබා දුන් ලේඛනයේ, උද්ඝෝෂනය හා වෙරළ සංරක්ෂනා හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුවට ආරක්ෂාව සැපයීමට නියෝජ්‍ය පොලිස්පති වෙතින් ඉල්ලීම් කල බවට දක්වා ඇත. ඒ අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තුමේන්තුව 2024.01.01 දින පොලිසිය වෙතින් ආරක්ෂාව ඉල්ලා ඇතිමුත් 2024.01.01ට පෙර සිට ශ්‍රී ලංකා පොලිසිය ඒ සඳහා සුදානම් වී ඇති බව එම කරුණු දැක්වීම තුළ පැහැදිලි වේ.

ඒ අනුව ලද බුද්ධි තොරතුර පිළිබඳව ප්‍රශ්න ගත වන අතරම මෙම ඉවත් කිරීමේ අනිතික බව හා පූර්ව සූදානම හේතුවෙන් මෙම පොලිස් බල ඇණි සුදානම් කරාද යන කරුණ මෙහිදි පැන නගී.

ඉහත කරුණු පිළිබඳ තවදුරටත් තහවුරු වනුයේ 2022.12.29 දාතමින් අධ්‍යක්ෂ ජනරාල් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ විසින්, අධ්‍යක්ෂ වෙරළ සම්පත් කළමණාකරන වෙත යොමුකරන ලද ලිපියේ .

"තවදුරටත් ගල්කිස්ස කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිද මෙම ඉවත් කිරීම සිදුකිරීම සඳහා අවශ්‍ය පොලිස් සහායෝගය ලබාදිය හැකි බව දන්වා සිටින ලදී." ලෙස එම ලිපියේ සඳහන් කර ඇත.

ඒ අනුව පොලිස් දෙපාර්තමේන්තුවේ මේ පිළිබඳව විශාල උනන්දුවකින් හා ඒ පිළිබඳව පූර්ව සූදානමක් තිබුනු බවට කරුණු නිරීක්ෂණය වේ.

එසේම මෙම ඉවත් කිරීම, ඉතාමත් කඩිනමින් ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් මත සිදුවූ බවට පහත දැක්වෙන වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය තුළින්ම පැහැදිලි වේ.

| | | |
|---|---|---|
| 2023.12.28 | - | උක්ත අනවසර ඉදිකිරීම් පවතින බවට දෙහිවල ස්ථානාධිපති දැනුම්දීම |
| 2023.12.28 | - | මහජන ආරක්ෂක අමාත්‍යතුමා විමසීම |
| 2023.12.29 | - | අධ්‍යක්ෂ වෙරළ සම්පත් වෙත එම ඉවත් කිරීම ලිඛිතව දැන්වීම |
| 2024.01.01 | - | 2024.01.01 දින දෙහිවල වෙරළ තීරයේ අනවසර ඉදිකිරීම කඩා ඉවත් කිරීමට, අධ්‍යක්ෂ වෙත බලය පැවරීම. |
| 2024.01.01 පැය 8.25 ට | - | ඉහත බලය පැවරූ කටයුත්ත 2024.01.01 දින පෙ.ව 9.30 ට සිදුකිරීමට පොලිසිය වෙතින් ආරක්ෂාව හා සහය ඉල්ලීම. |

ඒ අනුව නව වසරක ආයතනයක් වැඩ ආරම්භ කිරීමට ප්‍රථම බලය පවරා ලිපියක් නිකුත් කිරීම හා ඒ සඳහා ආරක්ෂාව ඉල්ලා පැමිණිලි කිරීම යන කාරණා තුළ මේ සඳහා ක්‍රියාකළ අති උද්‍යෝගය ප්‍රශ්න ගත වන අතරම එවැනිම කඩිනමකින් එම ඉවත් කිරීම සිදු කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්න ද ප්‍රශ්න සහගත වේ. ඒ අනුව ඉහත කරුණු තුළින් මෙම ඉවත් කිරීම ද්වේශසහගත හා යම් වෙනත් අවශ්‍යතාවයක් මත සිදුකළ බවට කරුණු ගම්‍ය වේ.

තවද මෙම ඉවත් කිරීම සිදුකිරීමේදී පැමිණිලිකරුවන් දුම්රිය දෙපාර්තමේන්තුවේ රක්ෂිතයට බදු මුදල් ගෙවා ලබාගත් කොටසේ ඉදිකර ඇති කොටසද ඉවත් කර ඇති බවට 2024.01.19 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථානීය පරීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇති අතරම 2 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට යොමු කරන ලද වාර්තාවට අදාල දක්වා ඇත්තේ "සෝල්බීච්" නැමති හෝටලය පිහිටි ඉඩම පිළිබඳ විමර්ශනය කිරීමේදී එහි අධ්‍යක්ෂක සම්පත් අත්තටගේ යන අය විසින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත රු.2553000.00 මුදලක් බදු වශයෙන් ගෙවූ බවට ලේඛන ඉදිරිපත් කල බවත්, විශේෂ අපරාධ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති විසින් 2023.12.27 වන දින දුම්රිය දෙපාර්තමේන්තුව දුම්රිය මූලස්ථාන සාමාන්‍යාධිකාරී හමු වී විමර්ශනයක් පවත්වා ඇති බවත්, එහිදී දුම්රිය දෙපාර්තමේන්තුව මෙතෙක් පරිහරණයට පර්චස් 6.3 ක ඉඩම කුලී පදනම මත ලබා දුන් බව දැක්වූ බවත් දක්වා ඇත.

ඒ අනුව පොලිස් දෙපාර්තමේන්තු නිලධාරින් මෙම හෝටලයේ මුහුණත දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් බව දැනුවත් වී තිබියදී මෙම කඩා ඉවත් කිරීමට සහය දක්වා ඇති බව නිරීක්ෂණය වේ. බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු 2024.01.01 MOIB 16/13 දෙහිවල පොලිස් ස්ථානයට කල ප්‍රකාශයට අනුව "පොලිසියේ ලොකුමහත්තුරු එම

ගොඩනැගිල්ල පෙන්වා කඩන්න කීවා" යන ප්‍රකාශය අනුව පොලිස් නිලධාරින් ඉහත දැනුවත් වීම තිබියදී මෙම කඩා ඉවත් කිරිමට සහය දක්වා ඇති බව ද නිරීක්ෂණය වේ.

එසේම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නොවන දුම්රිය දෙපාර්තමේන්තුවට බදු මුදල් ගෙවූ ගොඩනැගිල්ල මෙසේ අනීතිකව ඉවත් කිරීම තුළින් පැමිණිලිකාර පාර්ශවයට අගතියක් සිදු වී ඇති බව අවධානයට ලක් වේ. එසේම ප්‍රධාන වශයෙන් කඩා ඉවත් කර ඇත්තේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු කොටස වේ.

එසේම මානව හිමිකම් කොමිෂන් සභාවේ ස්ථානීය පරීක්ෂණයේ දී මීට සමගාමීව වෙරළ ආශ්‍රිතව වෙනත් හෝටල් අවන්හල් පවතින බවත් මේ වන විටත් ඉදි කරමින් පවතින බවටත් කරුණු නිරීක්ෂණයවන බව දක්වා ඇත.ඒ අනුව සොල් බීච් හෝටලය ඉවත් කිරීම පමණක් අවශ්‍යතාවය තිබුණු බව තහවුරු වනුයේ වගඋත්තර පාර්ශවයන්ට අනිකුත් හෝටල් හෝ අවන්හල් වල ඉදිකිරීම පිළිබඳව හා එහි අවසරලාභීත්වය හෝ බලපත්‍ර තිබේද ද යන්න පිළිබඳ කරුණු දැක්වීමට අසමත් වීම තුලිනි.

ඒ අනුව පැමිණිලිකරුවන් නීත්‍යානුකූල ලෙස වෙළඳ ව්‍යාපාරය නියුක්තව සිටියදී නියමිත ක්‍රමවේදයෙන් බැහැරව ගොස් අදාල ඉවත් කිරිම සිදු කිරිම තුළින් පැමිණිලිකරුවන් හෝ අන් අය සමඟ වෙළඳ ව්‍යාපාරයක නියුක්ත වීමේ අයිතිය අහිමි වී ගොස් ඇති අතර එතුළින් පැමිණිලිකරු ආර්ථිකමය හා සාමාජීය වශයෙන්ද හානියට පත්ව ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

මෙම හෝටලය ඉවත් කිරිමට ප්‍රථම තම නීත්‍යානුකූල රකියාව සිදු කරමින් එහි සේවකයන් 100 දෙනෙකුට වැඩි පිරිසක් සේවය කර ඇති බවට කරුණු දක්වා ඇත. ඒ අනුව යුක්තියට අදාළව ලද තොරතුර පදනම්ව හා සමගාමීව කඩිනමින් අත්නෝමතිකව සිදුකළ මෙම ඉවත් කිරිම තුළින් එම එහි නීත්‍යානුකූල රකියාවේ යෙදුනු පිරිසට හා ඔවුන්ගේ පවුල්වල පුද්ගලයන්ට සිදුවූ ආර්ථිකමය හා සාමාජියමය හානියද මෙහිදි බැහැර කළ නොහැක.

නීතිය ප්‍රකාරව වගඋත්තරකරුවන් විසින් අනවසර ඉදිකිරීමක් නීත්‍යානුකූල පරිපාටිය අනුගමනය කරමින් ස්වාභාවික යුක්ති මූලධර්මයනට අනුකූලව ඉවත් කිරීම කළ යුතුව ඇත. එවැනි ස්ථාන නීති විරෝධී ක්‍රියාවකට යොදා ගන්නේ නම් ඒ සඳහා පවතින නීතිය ප්‍රකාරව ක්‍රියා කිරීමේ හැකියාව හා බලය වගඋත්තරකරුවන් සතුය. එහෙත් මෙම සිද්ධියේදි එම නීත්‍යානුකූල ක්‍රියා පරිපාටියෙන් බැහැරව අත්තනෝමතික ලෙස වගඋත්තරකරුවන් ක්‍රියාකර ඇති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ඒ අනුව උක්ත කරුණු සලකා බැලීමේදි වගඋත්තරකාර පාර්ශවය නීතියේ නියම කර ඇති කාර්යය පටිපාටියට බැහැරව ඉතාමත් කඩිනමින් තමාගේ විෂය පථයට පරිබාහිරව මැදිහත්වී අත්තනෝමතිව මෙම ඉවත් කිරිම සිදුකිරිමට කටයුතු කිරිම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12 ව්‍යවස්ථාව හා 14 (1)(උ) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරමු.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරමු

01. නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත සිදුකරනු ලබන නිර්දේශ

පළමු වගඋත්තරකරු වන අධ්‍යක්ෂ ජනරාල් - (වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව) මෙහිදි ක්‍රියාකර ඇති ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

02. පොලිස්පතිවරයා 02, 03, 04 යන වගඋත්තර පාර්ශවය සම්බන්ධයෙන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීම කළ යුතුය.

03. පැමිණිලිකරුවන්ට හා එහි සේවකයන්ට නීත්‍යානුකූල රැකියාවක් කිරීමේ අවස්ථාව අහිමි කිරීම හේතුවෙන් එම කාල සීමාව තුළ සිදු වූ ආර්ථිකමය හානිය තක්සේරු කර සුදුසු වන්දි මුදලක් රජය විසින් එම සේවකයන් වෙත ලබාදීම කළයුතුය.

04. අත්තනෝමතික ලෙස ගොඩනැගිල්ල කඩා දැමීමෙන් පැමිණිලිකරුවන්ට සිදු වූ හානිය සම්බන්ධයෙන් රජයේ නිසි තක්සේරුකරුවෙකු ලවා පරීක්ෂා කර එම මුදල රජය විසින් ගෙවිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

05. අදාළ අමාත්‍යාංශ ලේකම් විසින් අදාළ අමාත්‍යවරයා මගින් වන්දි මුදල් ලබාදීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතුය.

2024.07.30 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත - 01. අමාත්‍යතුමා - නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන අමාත්‍යාංශය
12වන මහල, සෙත්සිරිපාය,
අදියර 2, බත්තරමුල්ල.

02. ලේකම් - නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන අමාත්‍යාංශය
12වන මහල, සෙත්සිරිපාය,
අදියර 2, බත්තරමුල්ල